# JK පුවත්

2022/23 1 වන කාර්තුව | 2022 අප්‍රේල්, මැයි සහ ජුනි පුවත්




## ජෝන් කීල්ස් සමූහය හා කීල්ස් ආයතනය USAID සමඟ එක්ව සුළු ව්‍යාපාර ව්‍යවසායකයින්ට අත්වැලක් සපයයි

වැඩි විස්තර සඳහා 06වන පිටුවට පිවිසෙන්න

# සම්මාන සහ පිළිගැනීම්




යූනියන් ඇෂුවරන්ස්, 2022 මාර්තු 8 වෙනි දා ශ්‍රී ලංකාවේ වඩාත්ම ආදරය කරන ජීවන රක්ෂණ සන්නාම නාම තුන අතරට එක්වන ලදි. මෙම පිළිගැනීම ලොව ප්‍රමුඛතම සන්නාම තක්සේරු උපදේශන සමාගම වන බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් සමග එක්ව LMD සඟරාව විසින් පිරිනමන ලදි.




යූනියන් ඇෂුවරන්ස්, 2022 මාර්තු 18 වෙනි දා ඉතාමත් ප්‍රසිද්ධ ජාත්‍යන්තර සම්මාන හතරක් දිනා ගන්නා ලදි. ග්ලෝබල් බිස්නස් සඟරාව විසින් පිරිනමන ලද මෙම සම්මාන සමාගමේ නව්‍යතා සහ ඩිජිටල්කරණයේ පුරෝගාමී ජයග්‍රාහණ ඇගයීමට ලක් කරන ලදි. යූනියන් ඇෂුවරන්ස් විසින් දිනා ගන්නා ලද සම්මාන වනුයේ 2022 ශ්‍රී ලංකාවේ හොඳම ඩිජිටල්කරණ ජීවිත රක්ෂණය, 2022 ශ්‍රී ලංකාවේ හොඳම නව රක්ෂණ සැලසුම, 2022 ශ්‍රී ලංකාවේ වඩාත් නව්‍ය අධ්‍යාපන රක්ෂණ සැලසුම සහ 2022 ශ්‍රී ලංකාවේ හොඳම CSR රක්ෂණ සමාගම ය.




2022 අප්‍රේල් 29 වෙනි දින බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ලංකා ශ්‍රේණිකරණයට අනුව 89.3 සන්නම් ප්‍රබලතාවයක් සහ AAA ශ්‍රේණිය යටතේ 2022 වසරේ ශ්‍රී ලංකාවේ ප්‍රබලතම සන්නාම නාමය ලෙස කීල්ස් නම් කරන ලදි. මෙය කීල්ස් සමාගම ලබාගත් විශාල ජයග්‍රාහණයකි. එපමණක් නොව කීල්ස්, ශ්‍රී ලංකාවේ වටිනාතම ශ්‍රී ලාංකීය සන්නාම නාම සහ වඩාත් වටිනා සුපිරි වෙළෙඳසැල් නාමය අතරින් හය වෙනි ස්ථානය අඛණ්ඩව හතරවෙනි වරටත් දිනා ගන්නා ලදි.

ජාතියේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා යන මෙම ගමනේ දී කීල්ස් වෙළෙඳසැල් සහ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන 5000 අධික සේවක කණ්ඩායමේ සියළුදෙනාගේම උත්සහාය සහ දායකත්වය නොමැතිව මෙම ජයග්‍රාහණය අත් කර ගැනීමට නොහැකි වනු ඇත.

# සමූහාධිපතිතුමාගේ පණිවුඩය

2022 මැයි 23 දින නිකුත් කරන ලද ජෝන් කීල්ස් සමූහයේ 2021/22 වාර්ෂික වාර්තාවෙන් උපුටා ගන්නා ලදී.



ක්‍රිෂාන් බාලේන්ද්‍ර
සභාපති

- අපගේ ව්‍යාපාර බොහෝමයක ක්‍රියාකාරිත්වය කොවිඩ්-19 වසංගතයට පෙර තිබූ තත්ත්වයට ළඟා වීමත් සමග විමර්ශන වර්ෂය තුළ සමූහය ඉතාමත් ශක්තිමත් ප්‍රතිසාධන මට්ටමක් වාර්තා කරන ලදි.

- විශේෂයෙන් සංචාරක ව්‍යාපාර සමූහය පසුගිය වර්ෂයේ වාර්තා කළ රුපියල් බිලියන 3.59 ක සෘණ පුනරාවර්තන EBITDA වලට සාපේක්ෂව මෙම වසරේ රුපියල් බිලියන 3.78 ක පුනරාවර්තන EBITDA වාර්තා කරමින් සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

- ඇමෙරිකානු ඩොලර් මිලියන 80කට සමාන වටිනාකමකින් යුත් JKH හී  ශ්‍රී ලංකා රුපියලට සමාන වටිනාකමකින් යුත්  කොටස් ආසියානු සංවර්ධන බැංකුවට පෞද්ගලික ස්ථාපිතයක් සිදු කිරීම 2021 දෙසැම්බර් මස කොටස්හිමියන් අනුමත කරන ලදි. ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක වටිනාකමකින් යුත් මෙහි පළමු රුපියල් ගනුදෙනුව 2022 ජනවාරි 19 වෙනි දා නිමා කරන ලදි.

- 2022 ජුලි මස ගෙවීමට නියමිතව තිබූ 'සිනමන් ලයිෆ්' හී ඇමෙරිකානු ඩොලර් මිලියන 395 ක ණය මුදල ඒකාබද්ධ ණය පහසුකමක් යටතේ 2021 දෙසැම්බර් මස ප්‍රතිමූල්‍යකරණය කරන ලදි. නව ණය පහසුකම තුළ  ඇමෙරිකානු ඩොලර් මිලියන 225 ක ණය මුදලක් සහ මුල් ණය මුදල කල් පිරෙන දිනයට සමගාමීව මාස හයක් සඳහා ලබා දුන් ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක ණය මුදලක් ඇතුළත් වේ.

- කොළඹ වරායේ WCT-1 ව්‍යාපෘතියේ ඉදිකිරීම, මෙහෙයවීම සහ පැවරීම (BOT) ගිවිසුමේ ඇතුළත් කොන්දේසිවලට අනුව ව්‍යාපෘති නිර්මාණය සහ පිරිවැය සහ අනෙකුත් සැලසුම් ක්‍රියාකාරකම් ඇතුළු සියළු කාර්‍යයන් නිමා කිරීමෙන් පසුව 2022 පෙබරවාරි මස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘති සමාගමට භාර දෙන ලදි.

- සමූහයේ දත්ත සහ උසස් විශ්ලේෂණ විශිෂ්ටත්ව මධ්‍යස්ථානය වන OCTAVE රීටේල් සහ පාරිභෝගික ආහාර කර්මාන්ත සමූහයන්හී 'භාවිත සිද්ධි' කිහිපයක් නියමු ව්‍යාපෘති සමග සාර්ථකව සම්බන්ධීකරණය කර අධ්‍යයනය කළ අතර උසස් විශ්ලේෂණ තොරතුරු යොදා ගෙන ව්‍යාපාරවලට මැදිහත්වීම හා පරිවර්තනය කිරීමේ වටිනාකම පැහැදිලි කරන ලදි.

- 'ONE JKH' නාමය යටතේ විවිධත්වය, සමානාත්මතාවය, අන්තර්කරණය (DE&I) වැඩසටහන අපගේ ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය වැඩි කිරීම, ආබාධිත පුද්ගලයින්ට රැකියා අවස්ථා ලබා දීම සහ LGBTIQ ප්‍රජාව ඇතුළත් කර ගැනීම යන අරමුණු ඇතිව ක්‍රියාකාරකම් රැසක් දියත් කරන ලදි.

- සමූහයේ රුපියල් මිලියනයක ආදායම සඳහා කාබන් නිකුතුව 18% කින් අඩු වූ අතර රුපියල් මිලියනයක ආදායම සඳහා ඉවතලන ජලය 19% කින් අඩු වී ඇත.

| | පුනරාවර්තන EBITDA* | | |
|---|---|---|---|
| **රු.'000** | **2021/22** | **2020/21** | **Variance** |
| ප්‍රවාහන | 6,140,923 | 3,610,416 | 2,530,507 |
| පාරිභෝගික ආහාර | 3,484,778 | 3,317,535 | 167,243 |
| රීටේල් | 7,549,338 | 5,522,678 | 2,026,660 |
| සංචාරක | 3,784,901 | (3,588,464) | 7,373,364 |
| දේපල | 7,867,199 | (17,348) | 7,884,546 |
| මූල්‍ය සේවා | 5,023,608 | 3,644,923 | 1,378,685 |
| අනෙකුත්, තොරතුරු තාක්ෂණය සහ වතු සේවා | 5,407,909 | 3,081,916 | 2,325,993 |
| සමූහය | 39,258,655 | 15,571,656 | 23,686,999 |

*EBITDA *තුළ පොලී ආදායම සහ බදු පසු ලාභ කොටස පදනම් කර ගත් හිමිකම් ආයෝජන කොටස ඇතුළත් නමුත් ව්‍යාපාරයන්හී සාමාන්‍ය මුදල් මෙහෙයුම් ක්‍රියාකාරිත්වය නිරූපණය කිරීම සඳහා විදේශ විනිමය හුවමාරු පාඩු සහ ලාභවල බලපෑම ඉවත් කර ඇත.*

# ආයතනික සමාජ වගකීම්

## ජෝන් කීල්ස් පදනම හබරණ පොලිස් ස්ථානය සමග තිබෙන උපායමාර්ගික හවුල්කාරිත්වය වර්ධනය කරයි.



ශ්‍රී ලංකා පොලිසියේ කාන්තා සහ ළමා කාර්යාංශය සමග සහයෝගීතාවය වර්ධනය කරමින් එහි ඉල්ලීම මත ජෝන් කීල්ස් පදනම විසින් හබරණ පොලිස් ස්ථානයේ කාන්තා සහ ළමා අංශය වෙත ඊ ස්ටුඩියෝ ඡායා පිටපත් යන්ත්‍රයක් සහ ජල ඩිස්පෙන්සර් යන්ත්‍රයක් පරිත්‍යාග කරන ලදි. WAVE ව්‍යාපෘතිය සහ ජොන් කීල්ස් *ප්‍රජා ශක්ති* හබරණ ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකමක් ලෙස සිනමන් ලොජ් හබරණ සහ සිනමන් හබරණ විලේජ් සමග හවුල්ව 2022 අප්‍රේල් 27 වෙනි දින මෙම පරිත්‍යාගය සිදු කරන ලදි.

මෙම යන්ත්‍ර භාරදීමේ උත්සවය හබරණ හෝටල් දෙකේ නියෝජිතයින් සහ හබරණ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව පවත්වන ලදි. හොටල් සංකීර්ණයේ නියෝජිතයන් අතර සාමාන්‍යාධිකාරී මර්ෆඩ් ෂාරිෆ් - හබරණ සංකීර්ණය, සහකාර කළමනාකරු - ෆවුම් ඉබ්‍රාහීන්, සිනමන් හබරණ විලේජ් - සංකීර්ණයේ ආරක්ෂක කළමනාකරු - ඉවාන් පෙරේරා, සහකාර ආරක්ෂක කළමනාකරු - විජිත කුමාර සහ සිනමන් නැචුරල් ට්‍රේල්ස් හි ස්වාභාවවේදී - ගයාන් ප්‍රදීප් ඇතුළත් විය. පොලිස් ස්ථානයේ නියෝජිතයින් අතර ASP හබරණ, පොලිස් නිලධාරී අබේසිංහ, හබරණ පොලිස් ස්ථානයේ OIC, පොලිස් නිලධාරී ජයලත් සහ OIC පරිපාලක, පොලිස් නිලධාරී බන්දුල ඇතුළත් විය.



## හික්කා බතික් ශිල්පීන් සඳහා ධාරිතා වර්ධනය සහ වෙළෙඳපොල ප්‍රවේශ සඳහා අත්වැලක්...

ජෝන් කීල්ස් පදනම (JKF), හික්කඩුව ජෝන් කීල්ස් *ප්‍රජා ශක්ති* වැඩසටහන යටතේ 2020 දී ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට හික්කා බතික් සන්නාම නාමය යටතේ ක්‍රියා කරන කාන්තාවන් 13 දෙනෙකුට පුහුණුව, නව නිෂ්පාදන සංවර්ධනය සහ නිර්මාණ වැඩමුළු, වෙළෙඳපොළ සම්බන්ධතා සහ මුල් අලෙවිය යනාදි විවිධ ක්‍රියාකාරකම් හරහා සහාය ලබා දෙන ලදි.

හික්කා බතික් ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට මෙන්ම සමූහ ව්‍යාපෘති හවුල්කරුවන් වන Artravale (වෝකර්ස් ටුවර්ස් හී සුබෝපභෝගී සන්නාම නාමය) සහ හික්කා ට්‍රාන්ස් සිනමන් සමග නව වෙළෙඳපොළ සම්බන්ධතා ගොඩනැගීමට ද JKF පහසුකම් සළසන ලදි.

මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් දෙනෙකු සමග අප්‍රේල් සහ මැයි මාසයන් හී බතික් ශිල්පීන් තීව්‍ර නවීන මෝස්තර පිලිබඳ අධ්‍යනය සඳහා වූ වැඩමුළු කිහිපයකට සහභාගී වුණු අතර මෙය කාන්තාවන්ගේ ආත්ම ශක්තිය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට හේතු විය.

හික්කා ට්‍රාන්ස් හී සාමාන්‍යාධිකාරී ලංකේෂ පොන්නම්පෙරුම මහතාගේ සහ ඔහුගේ කණ්ඩායමේ මගපෙන්වීම යටතේ හෝටලය මෙම අභියෝගාත්මක කාලයේ බතික් ශිලපීන්ගේ ආදායම වර්ධනය කරමින් පිරිවැය අවම කිරීම සඳහා ඔවුන් සමග එක්ව ඉවතලන රෙදි සේවක නිල නිවාසවල සහ මුළුතැන්ගේ භාවිතයට නැවත සකස් කිරීම වැනි තිරසාර ක්‍රියාකාරකම් රැසක් හඳුන්වාදෙන ලදි.

## ජෝන් කීල්ස් පදනම සුදුවැලිපොත වනාන්තර ප්‍රතිසංස්කරණය සඳහා ස්වෙච්ඡා සේවකයින් බලමුලු ගන්වයි.

2022 ලෝක පරිසර දිනය සනිටුහන් කරමින් ජෝන් කීල්ස් පදනම පිළිවෙලින් 2022 මැයි 21 සහ 2022 ජුනි 11 වෙනි දිනයන්හී සමූහයේ පළමු ස්වෙච්ඡා සේවක කණ්ඩායම් දෙක සිංහරාජ වන රක්ෂිතයට ආසන්නයේ කලවාන සුදුවැලිපොතෙහි 'සිනමන් වැසි වනාන්තර ප්‍රතිසංස්කරණ' ව්‍යාපෘතිය යටතේ රුක් රෝපණය සඳහා සිනමන් නේචර් ට්‍රේල්ස් හී ජේෂ්ඨ ජීව විද්‍යාඥ විමුක්ති වීරතුංග සහ රුක් රැකගන්නෝ හී සභාපති දුෂී පෙරේරා මහත්වරුන්ගේ මගපෙන්වීම යටතේ යොදවන ලදි.

මෙම ක්‍රියාකාරකම් දෙක සඳහා ස්වෙච්ඡා සේවකයින් 69 දෙනෙකු සහභාගී වූ අතර තවානේ සිට කඳු මුදුන කරා මිනිස් දම්වැලක් සාදමින් පැල රැගෙන යන ලදි. දුර සහ කඳු මුදුනේ ස්වභාවය සැලකිල්ලට ගත් විට මෙය එතරම් පහසු කටයුත්තක් නොවීය. ස්වෙච්ඡා සේවකයින්ට එම ස්ථානයේ පැල කිහිපයක් සිටුවීමේ අවස්ථාව ද ලැබුණි.

''එය වෙහෙසකර කාර්‍යයක් වූ නමුත් ව්‍යාපෘතිය තුළින් අප ලබා ගත් අද්විතීය අත්දැකීම නිසැකවම වටිනවා. කඳු නැගීමේදි කිහිප අවස්ථාවකදීම ඇද හැළුණු වර්ෂාව නොතකා ඉදිරියට යාමට අපව මෙහෙයවූයේ මෙම හේතුව යැයි'' ජෝන් කීල්ස් දේපල සමූහයේ ස්වෙච්ඡා සේවක ජනිත් පෙරේරා ඔහුගේ අත්දැකීම විස්තර කරමින් පැවසුවේ ය.





## ජෝන් කීල්ස් පදනම ඉංග්‍රීසි භාෂා ශිෂ්‍යත්ව ප්‍රතිලාභීන් හට දැනුවත් කිරීමේ වැඩසටහනක්.

ජෝන් කීල්ස් පදනම ලීඩ්ස් සමග එක්ව WAVE ව්‍යාපෘතිය (අධ්‍යාපනය හරහා ප්‍රචණ්ඩත්වයට එරෙහිව ක්‍රියා කිරීම) යටතේ අන්තර්ජාල ප්ලැට්ෆෝම් මත ළමා ආරක්ෂාව සහ ළමුන් අවදානමට ලක්විය හැකි අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමේ සැසි කිහිපයක් දියත් කරන ලදි.

කොළඹ 02, රනාල, නුවර, යාපනය, ත්‍රිකුණාමලය, හික්කඩුව, සූරියවැව, නෙළුව සහ හබරණ ඇතුළුව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හී වයස අවුරුදු 12 ත් 14ත් අතර ළමුන් 298 දෙනෙකුගේ සහභාගිත්වයෙන් අප්‍රේල් 25, සහ 26, මැයි 24 සහ ජුනි 3 යන දිනයන්හී පළමු සැසි හතර පවත්වන ලදි.

ලීඩ්ස් ශ්‍රී ලංකා හී දිල්රුක්ෂි ඉලංගකෝන් සහ ක්‍රිෂාන්තිනි කුමාරවේල් විසින් මෙම සැසි මෙහෙයවන ලද අතර අන්තර්ජාල ප්ලැට්ෆෝම් මත දැඩිව යැපෙන තරුණයන් මුහුණපාන විවිධ අභියෝග සහ මෙම අභියෝගයන් ජය ගැනීමට සහාය වන තාක්ෂණයේ ධනාත්මක අංග පිළිබඳව අවධානය යොමු කරන ලදි. මෙම සැසියන්හී ඉතාමත් ඉහළ අන්තර් ක්‍රියාකාරිත්වයක් දැක ගත හැකි වුණු අතර සහභාගීවූවන්ගේ යහපත් ප්‍රතිචාර සමගින් අවසන් විය.

රත්මලාන ප්‍රදේශයේ සිසුවෙකු වන සඳුල සුලක්කන මෙසේ පැවසුවේ ය. ''මෙම සැසි මට ඉතාමත් ප්‍රයෝජනවත් වුණා. මගේ ජීවිතයේ පළමු වතාවට අන්තර්ජාලය තුළ මම ආරක්ෂා වන්නේ කෙසේ ද යන්න පිළිබඳව මම ඉගෙන ගත්තා. මෙය මට හොඳ අත්දැකීමක්. අනෙකුත් සිසුන් සඳහා ද මෙම වැඩසටහන අඛණ්ඩව මෙහෙයවන ලෙස මම ජෝන් කීල්ස් පදනමෙන් ඉල්ලා සිටිනවා.''

ජෝන් කීල්ස් ඉංග්‍රීසි භාෂා ශිෂ්‍යත්ව වැඩසටහනේ ප්‍රතිලාභින් සඳහා මෙම සැසි මෙහෙය වන්නේ විවිධ ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභ රාශියක් එක් කොට ලබා දීම සඳහා වන අතර මෙයට අදාල ව්‍යාපෘති වනුයේ ELSP සහ WAVEය.

# සමූහයේ විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණ ක්‍රියාකාරකම්




විවිධත්ව, සාධාරණත්වය සහ අන්තර්කරණ (DE&I) යන සංකල්පයෙන් පෝෂිත සේවා පරිසරයක් ගොඩනැගීමේ සමූහයේ අවධානය වඩාත් තහවුරු කරමින් 'SanNap' වැඩසටහනේ පළමු අදියර 2022 ජුනි 13 වෙනි දා දියත් කරන ලදි. පළමු අදියර යටතේ ජෝන් කීල්ස් සමූහය සියළුම සේවිකාවන් සඳහා සනීපාරක්ෂක තුවා නොමිලේ ලබා දෙන ලදි.

දෙවන අදියර හරහා මෙම ප්‍රයත්නය පුළුල් කරමින් පවුලේ සාමාජිකයින් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරන අතර තමන් වෙනුවෙන් වෙන් කළ ප්‍රමාණය සිය පවුලේ කාන්තා සාමාජිකාවක් වෙත පිරිනැමීමට කැමති සියළුම සේවකයින් වෙත මෙම පහසුකම ලබා දීමට සමූහය අදහස් කරයි. මෙමගින් ජෝන් කීල්ස් පවුල පුළුල් කරමින් දැනුවත්භාවය සහ සහයෝගය වර්ධනය කරනු ඇත.

'SanNap' වැඩසටහනේ තවත් අංගයක් ලෙස සමූහය හේමාස් සමග එක්ව ආර්ථතාවය වීම හා සම්බන්ධ සෞඛ්‍යය අවදානම සහ පීඩනය අවම කිරීමේ අරමුණ ඇතිව සමූහයේ සේවකයන් සඳහා ඔසප් සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි කිහිපයක් සංවිධානය කරනු ඇත.




ජෝන් කීල්ස් සමූහය 2022 ජුනි 06 වෙනි දා අපගේ විද්‍යුත් අධ්‍යයන ප්ලැට්ෆෝමය හරහා සියළුදෙනාටම ප්‍රවේශ විය හැකි ත්‍රි-භාෂා ඊ-මොඩියුලයක් දියත් කරන ලදි. මෙමගින් සමූහය අපේක්ෂා කරන්නේ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය, LGBTIQ+ ප්‍රජාව කෙරේ පිළිගැනීම පිළිබද දැනුවත්භාවය වර්ධනය කිරීමයි. 2022 ජුනි මස සිට මෙම පාඨමාලාව සමූහයේ මූලික හඳුන්වා දීමේ වැඩසටහනේ කොටසක් පමණක් නොව ජෝන් කීල්ස්හි සියළුදෙනාම අනිවාර්යයෙන් සහභාගී විය යුතු දැනුම අළුත් කර ගැනීමේ වැඩසටහනක් ද වේ.

විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්කරණය (DE&I) ප්‍රධාන කණ්ඩායම ප්‍රධාන කාර්යාල ක්‍රියාකාරකම් හරහා අර්ථවත් වෙනසක් ඇති කිරීම සඳහා දියත් කළ 'ONE JKH' සහ DE&I වැඩසටහන් පිළිබදව දැනුවත් කිරීම සඳහා මාර්ග සංදර්ශන මාලාවක් ආරම්භ කරන ලදි.






කාන්තා කණ්ඩායම් සාමාජිකයින් දිරිමත් කිරීම සහ දැනුවත් කිරීමේ සැසිය වන WOICE හි 4වන සැසිය, 2022 ජුනි 30 වන දින පැවැත්විණි. මෙම සැසිය "සමතුලිතතාවය සවිබල ගැන්වීම" යන තේමාව යටතේ පවත්වන ලද අතර සිනමන් හොටෙල් සහ රෙසොර්ට් හි නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - හිෂාන් සිංහවංශ, ජේ කේ මාර්කටින් සර්විසස් හි අලෙවි ප්‍රධානි - නිලූෂා ප්‍රනාන්දු, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් හි අලෙවි කලමනාකරු - සුදීප වීරසේකර සහ ජෝන් කීල්ස් පදනමේ කළමණාකාරිණී - දේවන්ෂි ප්‍රනාන්දු මෙයට සහභාගී වූ අතර සහ එය මෙහෙයවනු ලැබුවේ සිනමන් බේ බෙන්තොට හි සහකාර මෙහෙයුම් කළමනාකරු ලශාන්තන් ගෝපාලන් විසිනි.

# සමුහයේ පුවත්

## සිනමන් හෝටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස්




සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් පවතින ආර්ථික අර්බුදය තුළ ජීවනෝපාය සඳහා සහායවීමෙහිලා අසල්වැසි ජනතාවට, දෛනික වැටුප් ලබන්නන්ට සහ අඩු ආදායම්ලාභීන්ට ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම සඳහා 'Meals that Heal' වැඩසටහන මෙවරත් පවත්වන ලදී. 'Flavours by Cinnamon' සන්නම්නාමය ප්‍රචලිත කිරීමේ එක් අංගයක් වන මෙම වැඩසටහනේ පළමු අදියර 2021 ජුනි මස දියත් කරන ලදි.

2022 ජුනි 08 වෙනි දිනට යෙදුනු ලෝක සාගර දිනය සමරමින් සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් විවිධ ව්‍යාපෘති රැසක් දියත් කරන ලදි.



සිනමන් එලයිඩෝ මාලදිවයින විසින් මත්ස්‍ය සංචලනය නොපෙනෙන ප්‍රදේශවල සිමෙන්ති, වැලි සහ වීදුරු කටු වලින් දේශීයව නිෂ්පාදනය කරන ලද කෘතීම ගල්පර ව්‍යුහයන් තැන්පත් කරන ලද අතර මෙය වීදුරු කටු වලින් සිදුවන සාගර දූෂණය වළක්වයි.



සිනමන් දොහොන්වෙලි මාලදිවයින 2018 වසරේ දී කොරල්පර ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර මේවන විට කලපුව වටා කොරල් රාමු 24 ක් ස්ථාපිත කර ඇති අතර මේවායේ වර්ධනය සහ නඩත්තුව සමීපව නිරීක්ෂණය කරනු ලැබේ.

සිනමන් හකුරා හුරා මාලදිවයින විසින් කොරල් පර ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර අතර ඉංජිනේරු කණ්ඩායම ආසන්න වශයෙන් වානේ රාමු 10 ක් පමණ සකස් කරනු ඇත. ඉතා සියුම්ව සාගරයෙන් ලබා ගත් සජීවී කොරල්පර සමුද්‍ර ජීව විද්‍යාඥයින් සහ පාසල් කිමිදුම් කණ්ඩායම විසින් රාමුවල බැද කලපුවේ තැන්පත් කරන අතර මෙමගින් කලපුවේ කොරල්පර වර්ධනය වේගවත් වනු ඇත.

සිනමන් හික්කා ට්‍රාන්ස් ශ්‍රී ලංකාවේ වෙරළ සහ සමුද්‍ර ජීව සංරක්ෂණ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර කැස්බෑවන් සහ අළුතෙන් සකස් කරන ලද කොරල්පර ආරක්ෂා කිරීම සඳහා අවධානය යොමු කිරීමේ නිවේදන ස්ථාපිත කරන ලදි.

සිනමන් ට්‍රින්කො බ්ලූ ද තුවාල වුණු මුහුදු කැස්බෑවන් සෙවීමට සහ පුනරුත්ථාපනය කිරීමට මෙන්ම රිසෝට් හී ඉදිරිපිට ඇති ඔවුන්ගේ කැදලිබිම් ආරක්ෂා කිරීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුවට සහාය වෙයි.



## සිනමන් ලේක්සයිඩ්



2022 මැයි 4වන දින කොළඹ පුරවරයේ ඇති සංකේතාත්මක ස්ථානයක් වන කොළෝම්බාර් වඩාත් නවීන සහ සිත්ගන්නා සුළු පරිසරයකින් යුතුව, කොළඹ සිනමන් ලේක්සයිඩ් හි එහි මුල් ස්ථානයටම නැවත ස්ථානගත කරන ලදී.

## සිනමන් වයිල්ඩ් යාල

2022 මැයි 15 වෙනි දින සියළුම දෙපාර්තමේන්තුවල සහභාගිත්වය ඇතිව සිනමන් වයිල්ඩ් යාල හෝටල් පරිශ්‍රයේ දී වෙසක් කූඩු තරගයක් පවත්වන ලදි. මුළුතැන්ගෙයි දෙපාර්තමේන්තුව පළමු ස්ථානය දිනා ගත් අතර දෙවෙන සහ තෙවෙන ස්ථාන පිළිවෙලින් F&B දෙපාර්තමේන්තුව සහ මූල්‍ය සහ මානව සම්පත් දෙපාර්තමේන්තුව දිනා ගන්නා ලදි. තරගය සඳහා සහභාගී වූ සියළුම දෙපාර්තමේන්තු ඉතාමත් අලංකාර නව්‍ය නිර්මාණ ඉදිරිපත් කර තිබුණි.



## සිනමන් දොහොන්වෙලි මාලදිවයින




2022 ජුනි 05 වෙනි දිනට යෙදුනු ලෝක මිහිකත දිනය දිවයිනේ හරිතකරණය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව නේවාසික සංචාරකයින් සහ සිනමන් නියෝජිතයින්ගේ සහභාගීත්වය ඇතිව රුක් රෝපණ වැඩසටහනක් මෙහෙයවන ලදි. මින් අනතුරුව සියළුදෙනාගේම සහභාගිත්වය ඇතිව පැන විසදුම් තරගයක් ද පැවැත් වූ අතර සැවොම ඉතාමත් උන්නදුවෙන් සහභාගීවෙමින් විනෝද විය.

## සිනමන් බේරුවල

2022 අප්‍රේල් 21 වන දින සිනමන් බේ බේරුවල විසින් සුවිශේෂී ගමනාන්ත භෝජන මාලාවක් හඳුන්වාදෙන ලදී. 'Breakfast on the Reef' සමගින් යුවළකට ඔවුන්ගේ උදෑසන ආහාරය මුහුදු ගල්පර තීරය මත ලබා ගැනීමේ ආදරණීය අත්දැකීමක් ලබාගැනීමට අවස්තාවක් උදා කරයි.



## සිනමන් බෙන්තොට බීච්

සිනමන් බෙන්තොට බීච් 2022 අප්‍රේල් 14 වෙනි දින දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ගේ සහභාගිත්වය ඇතිව ඉතාමත් උත්කර්ෂවත් සාම්ප්‍රදායික උත්සවයක් ලෙස ''සූර්ය මංගල්‍යය'' සමරන ලදි.



සාමාන්‍යාධිකාරීතුමා සහ කළමනාකරණය සමග කෙටි කථාබහක යෙදෙමින් කෝපි සංග්‍රාහය භුක්ති විදීමේ අවස්ථාව කණ්ඩායම් සාමාජිකයින්ට ලබා දෙන 'Coffee with GM' වැඩසටහන 2022 මැයි 3 වෙනි දා පවත්වන ලදි. කණ්ඩායම් සාමාජිකයින් වෙනුවෙන් විශේෂයෙන් නිර්මාණය කරන ලද කෝපයකින් කෝපි සංග්‍රාහ කරන ලදි.



## සිනමන් රෙඩ්

කොළඹ සිනමන් රෙඩ් විසින් සිය සේවකයන් අතර සබැඳියාව සහ සුහදත්වය වර්ධනය කිරීම සඳහා 2022 මැයි මස 27 වෙනි දින හෝටල් භූමියේ දී pop-up අලෙවිසැල් පවත්වන ලදී.




කොළඹ සිනමන් රෙඩ් 2022 මැයි 31 වෙනි දින තේ සෑදීමේ තරගයක් දියත් කළ අතර එය සියළුම සේවකයින්ට විවෘත විය.මෙම තරගය 'ක්ලැසික්' සහ 'නව්‍ය' වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ පවත්වන ලදි.



# සමූහයේ පුවත්

## සිනමන් ග්‍රෑන්ඩ්

සිනමන් ග්‍රෑන්ඩ් 2020 සහ 2021 වසරයන්හී දීර්ඝ සේවා සම්මාන උළෙල 2022 මාර්තු 31 වෙනි දින පවත්වන ලදි. ඕක් ශාලාවේ පැවති මෙම සම්මාන උළෙලේ දී 2020 සඳහා සේවකයින් 126 දෙනෙකුට ද 2021 සඳහා සේවකයින් 65 දෙනෙකුට ද සම්මාන පිරිනමන ලදි.







2021/22 මූල්‍ය වර්ෂයේ හතරවන කාර්තුව සඳහා වූ සිනමන් ග්‍රෑන්ඩ් සේවකයින්ගේ කාර්තු රැස්වීම 2022 අප්‍රේල් 07 වෙනි දා ඕක් ශාලාවේදී පැවැත්වුණි. සාමාන්‍යාධිකාරී කමල් මුණසිංහ විසින් සේවකයින් පිළිගනිමින් පසුගිය මූල්‍ය වර්ෂයේ හෝටලයේ කාර්‍යසාධනය පිළිබඳව කරුණු දක්වන ලදි.

## වෝකර්ස් ටුවර්ස්





වෝකර්ස් ටුවර්ස් එමිරේට්ස් සහ සිනමන් රිසෝට්ස් සමග එක්ව 2022 අප්‍රේල් 27 වෙනි දා සිට මැයි මස 01 වෙනි දා දක්වා හංගේරියාවේ සංචාරක නියෝජිතයින් 8 දෙනෙකුට සත්කාරකත්වය දක්වන ලදී.





වෝකර්ස් ටුවර්ස්, ෆ්ලෝකියෝ ජාලයේ හවුල්කරුවෙකු වූ අතර 2022 මැයි 2සිට 10වනදා දක්වා අනෙකුත් ගමනාන්ත කළමනාකරණ සමාගම් ත්‍රිත්වයක් සහ ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමඟ එක්ව ෆ්ලෝකියෝ සාමාජිකයින් හට ලංකාව තිරසාර ගමනාන්තයක් ලෙස හඳුන්වාදීම සඳහා සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරන ලදී.

## ජෝන් කීල්ස් ප්‍රොපටීස්

ට්‍රයි-සෙන් කුළුණු තුනේ ව්‍යුහාත්මක වැඩ නිමා කිරීම මෙම වසරේ ජනවාරි මස සැමරීමෙන් පසුව ඉදිකිරීම් වැඩ ක්‍රමයෙන් සිදු කරන ලදි. 2022 ජුනි 06 වෙනි දා වන විට යාන්ත්‍රික, විදුලි සහ ජලනල කටයුතු 40 වෙනි මහල දක්වා සම්පූර්ණ කර ඇති අතර නිමා කිරීමේ කටයුතු 20 වෙනි මහල දක්වා අවසන් කර ඇත. ට්‍රයි-සෙන් ඉදිකිරීම් අවසන් අදියර කරා ගමන් කිරීමත් සමග 2023 දී පාරිභෝගිකයන්ට මහල් නිවාස භාරදීමට බලාපොරොත්තු වන්නෙමු.





## සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස්

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් විසින් වත්මන් ආර්ථික අර්බුදයට සහ අපේක්ෂිත ආහාර හිඟයට මුහුණ දීමෙහිලා සමාගමේ සේවකයින් සවිබලගැන්වීමේ වැඩසටහන් මාලාවක් 2022 මැයි 12 වෙනි දින දියත් කරන ලදි.



## ජෝන් කීල්ස් ලොජිස්ටික්ස්



සියළුම බෙදාහැරීමේ මධ්‍යස්ථාන සහ ප්‍රධාන කාර්‍යයාලයේ JKLL කණ්ඩායම් 2022 අප්‍රේල් 18 සිට 20 දක්වා වර්ණවත් ඇඳුම්පැළඳුම්වලින් සැරසී සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්වල නියැලෙමින් සාම්ප්‍රදායික සිරිත්වලට අනුව සිංහල සහ දමිල අළුත් අවුරුද්ද සමරන ලදි.




වෙසක් උත්සවයේ ශාන්තබව නිරූපණය කරමින් JKLL කණ්ඩායම දිවයින පුරා බෙදාහැරීමේ මධ්‍යස්ථානවල වර්ණවත් සැරසිලි කරමින් වෙසක් උත්සවය සමරන ලදි.

## සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස්



වරාය ජැටියේ මෙහෙයුම් කාර්‍යක්ෂමතාවය වැඩිකිරීම සඳහා SAGT, Ship-to-Shore (STS) quay දොඹකර දෙකක් ගෙන්වන ලදි. ටොන් 65 ක් දක්වා වූ ද්විත්ව සෝපාන හැකියාව සමග විශේෂයෙන් තිරිංග, උසස් තාක්ෂණයෙන් යුත් සීමන්ස් ඩ්‍රයිව්ස් සහ අසමතුලිත බර හැසිරවීම, ගැටීම පාලන පද්ධති, දොඹකරයේ අධික බර, අධික වේගය, ස්නැග් ලෝඩ් ආරක්ෂණ පද්ධති, සම්පූර්ණ ක්‍රියාකාරී CCTV කැමරා සහ ක්‍රියාකරුගේ පහසුව මෙහෙයුම් කටයුතුවල ආරක්ෂාව තවදුරටත් වර්ධනය කරයි.



ගනුදෙනුකරුවන්ට වඩාත් කාර්‍යක්ෂම සේවාවක් සැපයීම සඳහා SAGT 2022 ජුනි 1 වෙනි දා කොළඹ වරාය සඳහා ප්‍රථම ස්වයං සේවා ඔන්ලයින් e-DA පහසුකම හඳුන්වාදෙන ලදි. මෙම පහසුකම හරහා ගනුදෙනුකරුවන්ට 24x7x365 පුරාම බහාලුම් ඩිලිවරි ඇඩ්වයිස් (e-DA) ලබා ගැනීමේ පහසුව ලබා දේ.

## කීල්ස්






රටෙහි පවතින ආර්ථික තත්වයත් සමඟ පීඩාවට පත් ජනතාවට උපකාර කිරීමේ අරමුණින්, 2022 මැයි 6 වන දින කීල්ස් විසින් "වඩාත් යහපත් හෙට දිනක් වෙනුවෙන්" වියළි සළාක පරිත්‍යාග වැඩසටහනක් දියත් කරන ලදී.

ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී, කීල්ස් සමග එක්ව 2022 මැයි මස 04 වෙනි දා ශ්‍රී ලංකාවේ සුළු, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත (MSMEs) සඳහා සහාය වෙමින් ජීවනෝපාය සංර්ධනය කිරීම තුළින් ජනතාව සවිබලගැන්වීමේ අරමුණින්, USAID සමග හවුල්කාරිත්ව ගිවිසුමක් අත්සන් කරන ලදි.






කීල්ස් වෙළෙඳසැල් කණ්ඩායම් සාමාජිකයින් දෛනිකව මුහුණ පාන අභියෝගතා අවබෝධ කර ගැනීම සඳහා 2022 අප්‍රේල් 27 වෙනි දා සහ මැයි 4 වෙනි දා CSA සහ Cashier සංසද පවත්වන ලදි.

## ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන්

2022 ජුනි 6වෙන දින පැවති ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියානු සංචාරක ක්‍රිකට් තරඟාවලිය සඳහා නිල විකාශන මාධ්‍ය වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ චැනල් අයි සමඟ ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් හවුල් වූ අතර, තරඟයේ නිල වාර්තා සහ දත්ත විකාශනය කිරීම සඳහා JKOA විසින් LED පැනලයක් පිරිනමන ලදී.






# සමූහයේ පුවත්

## යූනියන් ඇෂුවරන්ස්




2022 මැයි 24 වෙනි දින යූනියන් ඇෂුවරන්ස් හඳුන්වාදුන් රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රථම විස්තීර්ණ ඩිජිටල් විසඳුම වන 'ක්ලික් ලයිෆ් ඇප්' රක්ෂණ සැලසුම් කළමනාකරණය, ආකර්ෂණීය විශේෂාංග වලින් සමන්විත වන අතර උපයාගත් ලෝයල්ටි ලකුණු මත ගනුදෙනුකරුවන්ට වටිනා ප්‍රතිලාභ පිරිනමයි.




ඉහළ කාර්යසාධනයකින් යුත් නියෝජිතයින් ඇගයීම සඳහා යූනියන් ඇෂුවරන්ස් 2021 වාර්ෂික නියෝජිත සම්මාන උළෙල පවත්වන ලදි. 'විශිෂ්ටයින්ට කිරුළ පැළඳවීම' යන තේමාව යටතේ මෙම උත්සවය 2022 මැයි මස 08 වෙනි දා මොනාර්ච් ඉම්පීරියල් හීදී පවත්වන ලදි.

## ජෝන් කීල්ස් පීඑල්සී



2022 අප්‍රේල් 20 වන දින සිට මැයි 31දක්වා පැවත් වූ තේ වෙන්දේසියන් හි, හය වන වරටත් ටී ස්මෝල් හොල්ඩර්ස් විසින් කළමනාකරණය කරන ලද හින්ගල්ගොඩ තේ කම්හල විසින් නිෂ්පාදිත තේ, වාර්තාගත ඉහලම මිලට වෙන්දේසි විය. මෙම ඉහළ ප්‍රමිතියේ තේ නිෂ්පාදනයන් ජෝන් කීල්ස් විසින් අලෙවි කරන ලදී.



2022 අප්‍රේල් 22 වෙනි දා ජෝන් කීල්ස් පීඑල්සී සිංහල සහ දමිල අළුත් අවුරුද්ද සමරන ලදි. කොත්තු රාත්‍රියක් සමග පැවැත් වූ මෙම වැඩසටහන තුළ සාම්ප්‍රදායික ක්‍රීඩා රැසක් ඇතුළත් විය.

## සෙන්ටර් ෆන්ක්ෂන්ස්

2022 ජූනි 29 වන දින, සිල්ලර අංශය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වූ "The Quizathon Fifth stop", 130 කට අධික ප්‍රේක්ෂක පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත් වූ අතර සිල්ලර අංශයේ සභාපති චරිත සුබසිංහ මහතා ද එයට සහභාගි විය. තරගයේ වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් JMSL කණ්ඩායමේ රුෂිකා ලියනගේ තරගයේ ජයග්‍රාහිකාව බවට පත්විය.




2022 ජෝන් කීල්ස් කළමනාකරණ පුහුණු වැඩසටහන 2022 ජූනි 01 වෙනි දා සිට 15 වෙනි දා දක්වා විවෘතව පැවති අතර අයදුම්කරුවන් 652 අයදුම් කරන ලදි. අයදුම් ක්‍රියාවලියේ එක් අංගයක් ලෙස වීඩියෝවක් ඉදිරිපත් කිරීමට ද තිබුණි.



## ජෝන් කීල්ස් රිසර්ච්



2022 ජූනි 5 වන දින ජෝන් කීල්ස් රිසර්ච් අංශය විසින් තම වෙබ් අඩවිය දියත් කරන ලදී. මෙය JKR හී පර්යේෂණ ක්ෂේත්‍ර, තාක්ෂණ සේවා සහ පර්යේෂණ සඳහා JKR සමග සම්බන්ධවන ආකාර යනාදි තොරතුරු ඇතුළත් වෙබ්අඩවියකි. නව පර්යේෂණ සොයා ගැනීම් සහ JKR කණ්ඩායමේ ජීවිතය පිළිබඳ ලිපි ඇතුළත් බ්ලොග් අඩවියක් ද මෙහි ඇතුළත් ය. https://www.johnkeellsresearch.com හරහා මෙම වෙබ් අඩවියට පිවිසිය හැකි ය.



2022 අප්‍රේල් 19 වෙනි දා ෆෝඑවර් ස්කින් නැචුරල්ස් පෞද්ගලික සමාගම JKR හී හිමිකාරත්වය සහිත සිල්මෙටික්ඔඑ තාක්ෂණය ලබා දෙමින් එහි තාක්ෂණ හුවමරු ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලදි. JKR හී සිල්මෙටික්ඔඑ තාක්ෂණය යොදා ගෙන ෆෝඑවර්, එහි උපසන්නම් නාමය වන Derma PRO යටතේ සම සුරැකුම් නිෂ්පාදන පෙලක් නිෂ්පාදනය කරනු ඇත.

## ඔක්ටේව්




උපාධි අපේක්ෂකයින් සඳහා වූ ඔක්ටේව් පැන රාත්‍රිය 'Let's Talk Data!' තේමාව යටතේ 2022 අප්‍රේල් 01 වෙනි දා ප.ව. 6.00 සිට 7.00 දක්වා මයික්‍රොසොෆ්ට් ටීම් හරහා පවත්වන ලදි. මෙය මෙහෙයවන ලද්දේ දත්ත විද්‍යාඥ ලේෂක කරුණාරත්න, දත්ත විද්‍යාඥ තිරාජ් සිල්වා සහ දත්ත විද්‍යාඥ සහ ආශ්‍රිත ඉංජිනේරු චාරක අබේවික්‍රම විසිනි.




2022 ඔක්ටේව් උසස් විශ්ලේෂණ සම්මේලනය 2022 මැයි මස 20 වෙනි දා ඔන්ලයින් පවත්වන ලදි. අවසාන වසර විශ්වවිද්‍යාල සිසුන්ට සහ උපාධිධාරීන්ට ඔවුන්ගේ දත්ත සහ උසස් විශ්ලේෂණය හා අදාල පර්යේෂණවල සොයාගැනීම් ඉදිරිපත් කිරීමට මෙමගින් අවස්ථාව ලබා දෙන ලදී.



OCTAVE Virtual Experience දිනය 2022 ජූනි 3 වන දින උදෑසන 9 සිට පස්වරු 2 දක්වා Microsoft Teams හරහා පවත්වන ලදී. සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් හි සිල්ලර කර්මාන්ත අංශයේ සහ බීම සහ අයිස්ක්‍රීම් ව්‍යාපාර ඒකකවල විශ්ලේෂණ භාවිතයන් ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීම මෙහි අරමුණ විය. ජෝන් කීල්ස් සමූහයේ සේවකයින් සඳහා OCTAVE සමග සජීවී ප්‍රශ්නෝත්තර සැසියක් ද පැවැත්විය.

## ප්ලාස්ටිසයිකල්




2017 ජූලි මස ප්ලාස්ටිසයිකල් ආරම්භ කළ දිනයේ සිට 2022 අප්‍රේල් 31 දක්වා ශ්‍රී ලංකාව තුළ පවත්නා එහි කසල බඳුන් සංඛ්‍යාව වේගයෙන් වර්ධන කරමින් කිලෝ ග්‍රෑම් 100,000 ක් පමණ ප්ලාස්ටික් එක්රැස් කිරීමේ සුවිශේෂී කඩඉම පසු කරන ලදි.



2022 ජූනි 05 වෙනි දිනට යෙදුනු ලෝක පරිසර දිනය සැමරීම සඳහා ප්ලාස්ටික් සයිකල්, මයික්‍රොසොෆ්ට් ටීම් සහ ෆේස්බුක් හරහා සජීවී දේශනයක් පැවැත් වූ අතර තිරසාරත්ව ක්ෂේත්‍රයේ කථිකයින් තිදෙනෙකු විසින් ප්ලාස්ටික් දූෂණයෙන් අපගේ පරිසරයට සිදුවන බලපෑම සහ එයට විසඳුම් යන තේමාව ඔස්සේ කථා කරන ලදි.

## ජෝන් කීල්ස් X



2021 දෙසැම්බර් හි ඉල්ලුම් පත්‍ර සඳහා විවෘත වූ ජෝන් කීල්ස් X හි JKX Accelerate - Startup Accelerator, JKX Innovate - Open Innovation Platform and JKX Elevate - investments for scaleups මාර්ග 3 ඇතුලත් වැඩසටහන ආරම්භ කරන ලදී.

# ක්‍රීඩා, සමාජ හා සමිති

## ක්‍රිකට්

2022 ජුනි 25 වන දින MCA පිටියේ පැවති MC සුපර් ප්‍රිමියර් T20 තරඟාවලියේ අවසන් මහා තරඟයේදී MODE Engineering කණ්ඩායම ලකුණු 4කින් පරාජය කරමින් John Keells සමූහය ජයග්‍රාහකයින් බවට පත් විය. ප්‍රථමයෙන් පන්දුවට පහර දීමට ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයට අවස්ථාව ලබා දීමත් සමඟ දැඩි අසීරුතාවයකට පත් වුවත් පස්වැනි කඩුල්ල සඳහා ලකුණු 94ක් සමඟ තරගයේ ජයග්‍රාහී සබඳතාව ගොඩනැගීමට අංක තුන පිතිකරු කවින් බණ්ඩාර සහ අංක හය පිතිකරු සචිත ජයතිලක සමත් විය. බණ්ඩාර පන්දු 33කදී හතරේ පහර 2ක් සහ හයේ පහර 2ක් සමඟින් ලකුණු 42ක් රැස් කළ අතර ජයතිලක පන්දු 39කදී හයේ පහර 7ක් සමඟින් ලකුණු 62ක් රැස් කළේය. ජයග්‍රහණය සඳහා ලකුණු 157 ක ඉලක්කයක් හඹාගිය JKH, අවසන් ඕවරයේදී ත්‍රාසජනක ජයග්‍රහණයක් ලබා ගැනීමට සමත් වූ අතර අවසන් තරගයේ වීරයා ලෙස ලකුණු 12 ක් රැස් කරගත් සචිත ජයතිලක හට පිරිනැමිණි. ඉෂාන් ජයරත්න ද සිය ඕවර හතරේදී ලකුණු 14කට කඩුලු 3ක් දවාගනිමින් පන්දුවෙන් දස්කම් දැක්වීම කැපී පෙනිණි.




ජෝන් කීල්ස් ප්‍රවාහන අංශයේ ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය 2022 මැයි 28 වෙනි දා කොළඹ 02 මැලේ ක්‍රිකට් පිටියේ දී පැවැත්විණි. සේවකයින්ගේ සහභාගිත්වය සහ උද්යෝගය වර්ධනය කරමින් කණ්ඩායම් අතර අභිප්‍රේරණය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව මෙම තරගය සංවිධානය කරන ලදි.

මැක් ඉන්ටර්නැෂනල් ෆ්‍රෙයිට් නියෝජනය කළ MIF රොක්ස් කණ්ඩායම තරගය ජයග්‍රාහණය කළ අතර සිනමන් එයාර් නියෝජනය කළ SAF Hawks කණ්ඩායම අනුශූරතාවය දිනා ගන්නා ලදි.

කණ්ඩායමකට කාන්තා නියෝජනයක් තිබීම අනිවාර්යය වූ අතර තරගයේ දක්ෂතම ක්‍රීඩිකාවද තෝරන ලදි.



## හොකී



2022 මැයි 28, ජුනි 04, ජුනි 11 සහ ජුනි 15 යන දිනයන්හී කොළඹ ඇස්ට්‍රෝ හොකී පිට්ටනියේ පැවති 2022 මර්කන්ටයිල් හොකී ලීග් තරගයේ දී ජෝන් කීල්ස් සමූහය වසර 16 පසුව සී කාණ්ඩයේ දෙවෙනි ස්ථානය දිනා ගන්නා ලදි.

පළමු පෙල (වමේ සිට දකුණට අසුන්ගෙන ඇති) ක්ලිව් ප්‍රනාන්දු, තේනුක වීරසිංහ, උදේෂ් ප්‍රියංක, ගනේෂන් ජයප්‍රකාසම්, ඉසුරු කරුණාරත්න
දෙවන පෙල (වමේ සිට දකුණට අසුන්ගෙන ඇති) සංජීව හසන්ත, සසංක මහාආරච්චි, හැරිසෝටයින් ෆැන්සිස්, ඩිලාන් නිරෝෂාන්, ගොඩ්වින් සොලොමන්ස්, ෂෙරොන් ෆාබියන් (නායක), බෙවාන් ගුණවර්ධන, පේෂල අරවින්ද, ලකිඳු විජේසිංහ
නොපැමිණි - ගයාන් ජයසේන, ගිහාන් අසංක

තරගයේ ප්‍රථිඵල මෙසේ ය.

| | |
|---|---|
| 2022 මැයි 28 - JKH සහ HNB (1-1 සමාන) | - JKH සඳහා ගොඩ්වින් සොලොමන්ස් ලකුණු ලබා ගන්නා ලදි. |
| 2022 ජුනි 04 - JKH සහ සෙලාන් (2-2 සමාන) | - JKH සඳහා ගොඩ්වින් සොලොමන්ස් සහ හැරිසෝටයින් ෆැන්සිස් ලකුණු ලබා ගන්නා ලදි. |
| 2022 ජුනි 11 - JKH සහ සිංගර් (1-3 අහිමි ) | - JKH සඳහා ඩිලාන් නිරෝෂාන් ලකුණු ලබා ගන්නා ලදි. |
| 2022 ජුනි 15 - JKH සහ බ්‍රවුන්ස් (2-1 දිනුම්) | - JKH සඳහා බෙවාන් ගුණවර්ධන සහ ක්ලිව් ප්‍රනාන්දු ලකුණු ලබා ගන්නා ලදි. |

# ප්‍රශ්නාවලිය




පහත සඳහන් ප්‍රශ්න 6ට පිළිතුරු සපයා වටිනා තෑගී දිනාගන්න!

ඔබ කළ යුත්තේ ජෝන් කීල්ස් පුවත් හි නවතම කලාපය මත පදනම් වූ සරල ප්‍රශ්න 5කට පිළිතුරු සැපයීමයි! 2022 ආගොස්තු 19 හෝ ඊට පෙර isuri.jkh@keells.com වෙත ඔබේ නම, BU සහ දුරකථන අංකය සමඟ ඔබේ පිළිතුරු එවන්න.

1. සුදුවැලිපොතෙහි 'සිනමන් වැසි වනාන්තර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ රුක් රෝපණය සඳහා ජෝන් කීල්ස් පදනම ස්වෙච්ඡා සේවකයින් කීදෙනෙක් යොදවන ලදි ද?
2. 'SanNap' වැඩසටහනේ පළමු අදියරයේ අරමුණ කුමක් ද?
3. සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස්හී සේවකයින් සඳහා හඳුන්වාදුන් නව වැඩසටහන කුමක් ද?
4. 'OCTAVE Quiz Night' හී තේමාව කුමක් ද?
5. 29වන සිංගර් MCA සුපර් ප්‍රිමියර් ලීග් තරඟාවලියේ හොඳම පන්දු යවන්නා ලෙස සම්මාන ලැබුවේ කවුරුන්ද?



**JK පුවත් පසුගිය ප්‍රශ්නාවලියේ ජයග්‍රාහකයා**

**නිරූෂි නානායක්කාර**
සබඳතා විධායක
යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී

මෙම පුවත්පත ජෝන් කීල්ස් සමූහය තුළ බෙදාහැරීමට පමණි.
ඔබේ ප්‍රතිචාර යොමුකරන්න.

**ඉසුරි අබේවික්‍රම**
විධායක - සමූහ සන්නිවේදන අංශය
(Corporate Communications)

117 චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 2. දු.ක.: +94 (0) 11 230 6191,
වි.තැපැල්: jkh@keells.com වෙබ් අඩවිය: www.keells.com